# ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය

ක්‍රි.ව 1848 වර්ෂයේ පැවැති සටන නිමවීමෙන් පසු ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ගැනීමට කටයුතු කළ අවධිය ප්‍රධාන කාලඡේද දෙකකට බෙදාගත හැක.

**කාලඡේද**

**දේශපාලන උද්ඝෝෂණ පැවති සමය**
**1915 - 1948**

**ආගමික හා ජාතික පුනරුද සමය**
**1850 - 1915**

ක්‍රි.ව 1815 උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත්වීමෙන් පසු මෙරට සාම්ප්‍රදායික ආගම් හා සංස්කෘතියේ පැවැත්මට බාධා එල්ල විය. මේ නිසා 19 සියවසේ අග භාගයේ දී මෙරට බෞද්ධ, හින්දු හා ඉස්ලාම් ජනතාව තුල ආගමික හා ජාතික වශයෙන් මහත් ප්‍රබෝධයක් ඇති විය. මෙය ජාතික පුනරුදය වශයෙන් නම් කළ හැක.

1. පෘතුග්‍රීසින් හා ලන්දේසින් මෙරට මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ සමයේ ආගමික හා සංස්කෘතික කටයුතු පැතිරවීම අරමුණ විය.
2. මුල් කාලයේ සිට ක්‍රි.ව 1815 තෙක් උඩරට රාජධානිය ස්වාධීන රාජ්‍යයක් ලෙස පැවතීම.
3. ක්‍රි.ව 1815 පසුව බ්‍රිතාන්‍ය පාලනය යටතේ බටහිර සංස්කෘතිය රටපුරාම පැතිරයාම ආරම්භ විය.

# මිෂනාරි සංවිධානවල කටයුතු

බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරටට පැමිණි විශේෂ සංවිධාන කීපයක් කිතුනු දහම රටතුල පැතිරවීමට ක්‍රියා කළේය. එම සංවිධාන මිෂනාරි සංවිධාන යනුවෙන් හැඳින්වේ. ඔවුන් කිතුනු දහම පැතිර වූ සංවිධාන පහත පලවේ.

| මිෂනාරි සංවිධානය | වර්ෂය | ප්‍රදේශ |
|---|---|---|
| ලන්ඩන් මිෂනාරි සමාගම | ක්‍රි.ව 1804 | |
| බැප්ටිස්ට් මිෂනාරි සමාගම | ක්‍රි.ව 1812 | කොළඹ |
| වෙස්ලියන් මිෂනාරි සමාගම | ක්‍රි.ව 1814 - 1815 | උතුරු හා නැගෙනහිර |
| ඇමරිකන් මිෂනාරි සමාගම | ක්‍රි.ව 1816 | යාපනය |
| චර්ච් මිෂනාරි සමාගම | ක්‍රි.ව 1818 | කොළඹ, ගාල්ල, කල්පිටිය, මන්නාරම, මහනුවර. |

## ලේඛන මාධ්‍යය යොදා ගැනීම

- බ්‍රිතාන්‍ය ක්‍රිස්තු ධර්මය පැතිරවීම සඳහා ලේඛන මාධ්‍යය යොදා ගත්තේය.
- තමන්ට ප්‍රධාන ගැටලුවක් වූයේ දේශීය මාධ්‍ය භාෂාය.
- දේශීය භාෂා දැනුම ලබාගැනීම සඳහා මිෂනාරි පූජකවරු සිංහල, දෙමළ වැනි භාෂා හැදෑරුවේය.
- මිෂනාරි ක්‍රිස්තියානි සමාගම් විසින් එළි දැක්වූ ප්‍රකාශන කීපයක් පහත දැක්වේ.

| මුද්‍රණය කළ වසර | ප්‍රකාශකගේ නම | මුද්‍රණය කළ සංවිධානය |
|---|---|---|
| ක්‍රි. ව 1832 | මාසික තෑග්ග | චර්ච් මිෂනාරි සමාගම |
| ක්‍රි. ව 1840 | ලංකා නිධානය | ආගමික සුස්තිකා සංගමය |
| ක්‍රි. ව 1842 | උරගල | බැප්ටිස්ට් සමාගම |

## දේශපාලන මාධ්‍ය අධ්‍යයනය

- මිෂනාරි පූජකවරු පන්සල් හා මහජනයා ගැවසෙන ස්ථානවල දේශන පවත්වා තම ආගමික ප්‍රචාරවල නිරත වූහ.
- පාසල් ආරම්භ කිරීම හා ඒවා පවත්වාගෙන යාමට කැපවීමෙන් කටයුතු කලහ.
- එම පාසල්වල ආගම් ප්‍රචාරයට මුල්තැන හිමිවිය.
- මෙම අධ්‍යාපන කටයුතු වලට රජයේ අනුග්‍රහය ලැබුණි.
- සිංහල හා දෙමළ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීම සඳහා මිෂනාරි පාසල්වලට යාමට සිදුවිය.

## බෞද්ධ පුනරුදය සඳහා ගත් ක්‍රියාමාර්ග

- පිරිවෙන් පිහිටුවීම
- මුද්‍රණාල පිහිටුවීම
- සඟරා හා පුවත්පත් මුද්‍රණය කර බෙදා හැරීම
- ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම
- බෞද්ධ පාසල් පිහිටුවීම

| ආරම්භ කළ හිමිවරු | ඉදිකළ පිරිවෙන |
|---|---|
| 1. වලානේ සිද්ධාර්ථ හිමි | රත්මලානේ පරමධර්ම චේතිය |
| 2. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි | මාලිගාකන්ද විද්‍යායෝදය |
| 3. රත්මලානේ ධර්මාලෝක හිමි | පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන |
| | |
| **බෞද්ධ පුනරුදයේ නායකයන්** | **ඔවුන්ගෙන් සිදුවූ සේවය** |
| මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි | ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම |
| හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා | බෞද්ධ පාසල් පිහිටුවීම්<br>පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම<br>බෞද්ධ පාසල් අරමුදලක් පිහිටුවීම<br>වෙසක් පෝය නිවාඩු දිනයක් කිරීම.<br>බෞද්ධ කොඩිය නිර්මාණයට කටයුතු කිරීම |
| අනගාරික ධර්මපාල තුමා | ප්‍රසිද්ධ විවාද පැවැත්වීම<br>සිංහල බෞද්ධයා, මහා බෝධි සඟරාව වැනි ප්‍රකාශනවලට ලිපි සැපයීම.<br>බුද්ධගයාව ආරක්ෂා කර ගැනීම |
| වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා | අනුරාධපුරයේ පූජනීය ස්ථාන රැකගැනීමට සංවිධාන පිහිටුවීම |

## ▪ මුද්‍රණාල පිහිටුවීම

බෞද්ධයන්ට අඩුපාඩුව පැවති මුද්‍රණාලයක් පිහිටුවීම. (ලංකෝපකාර) පූජ්‍ය බුලත්ගම ධර්මාලංකාර සිරි සුමනතිස්ස හිමි ක්‍රියා කළේය. ක්‍රි.ව 1862 ගාල්ලේ මෙය පිහිටුවිය. ඉන්පසු පිහිට වූ මුද්‍රණාල මෙසේය.

- ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය
- කවටකතික මුද්‍රණාලය
- සුදර්ශන මුද්‍රණාලය
- සරසවි සදරැස මුද්‍රණාලය




## ▪ බෞද්ධ ප්‍රකාශන

- ලක්මිණි පහන
- ලංකා ලෝකය
- සරසවි සඳරැස
- සිංහල ජාතිය
- සිංහල බෞද්ධයා


LAK-MINI-PAHANA

## ▪ ප්‍රසිද්ධ වාද විවාද පැවැත්වීම.



- පංචමහා වාදය
- බද්දේගම වාදය - 1865
- වරාගොඩ වාදය - 1865
- උදන්විට වාදය - 1866
- ගම්පොල වාදය - 1871
- පානදුරා වාදය - 1873

මෙම විවාද අතරින් පානදුරා වාදයට ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලැබුණි. එම වාදයේ දී බෞද්ධ පක්ෂය වෙනුවෙන් මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් වාද කළහ. මෙම වාද පිළිබඳ ලේඛණ කියවීමෙන් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා හා බැලැවැස්කි මැතිණිය ලංකාවට ආහ.





## ▪ අමද්‍යප ව්‍යාපාරය

- බ්‍රිතාන්‍ය පාලනය යටතේ දිවයිනේ තැබෑරුම් විවෘත කර මධ්‍යසාර භාවිතය තුළින් හා පැතිරයාම නිසා සමාජ ගැටලු නිර්මාණය වෙමින් තිබිණි.

මේ නිසා බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නායකයන් මද්‍යසාර භාවිතයට එරෙහිව ජනතාව දැනුවත් කළහ.

ඊට නායකත්වය ගත් අය :

- ✓ අනගාරික ධර්මපාලතුමා - ප්‍රසිද්ධ දේශන
- ✓ පියදාස සිරිසේන මහතා - නවකතා
- ✓ ජෝන්ද සිල්වා මහතා - නාට්‍ය මගින් (පරාභව)

- ## හින්දු ආගමික පුනරුදය

| නායකයන් | කළ සේවය |
|---|---|
| ආරුමුග නවලර්තුමා | යාපනයේ වන්නාර් පන්නෙයි ප්‍රදේශයේ මුද්‍රණාලයක් පිහිටුවීම. ලේඛණ මාර්ගයෙන් ජනතාව දැනුවත් කිරීම. 'උදයභාණු' පුවත්පත ආරම්භ කිරීම. දමිළ සිසුන්ට කාණ්ඩ 3 ක පෙළ පොතක් රචනා කිරීම. ගද්‍ය පද්‍ය පොත් කීපයක් පරිවර්තනය කරවීම. (පෙරිය පුරාණම්, ස්කන්ධ පුරාණම්)<br>1894 වර්ණාර් පණ්නෙයි ශෛව ප්‍රකාශ විද්‍යාලය පිහිටුවීම. ශෛව පරිපාලන සභාව හා හින්දු අධ්‍යාපන සභාව මගින් හින්දු පාසල් පිහිටුවීම.<br>1872 යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කළේය. (හින්දු විද්‍යාලය) |
| සර් පොන්නම්බලම් රාමනාදන් මහතා | 1915 වසරේ ආණ්ඩුව යුද්ධ නීතිය පනවා බෞද්ධයන් එරෙහිව දැඩි මර්දනයක් ඇතිකල අවස්ථාවේ බෞද්ධයන් වෙනුවෙන් හඬ නැගීය. |
| පොන්නම්බලම් අරුනාචලම්තුමා | 1919 වර්ෂයේ දී ලංකා ජාතික සංගමය පිහිටුවීමට මූලිකත්වය ගැනීම. |

- ## ඉස්ලාමික ආගමික පුනරුදය

| නායකයන් | කළ සේවය |
|---|---|
| M.C. සිද්දි ලෙබ්බේ මහතා | මුස්ලිම් ජනතාව තුල අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති කිරීම.<br>ඉංග්‍රීසි භාෂාව හා අරාබි භාෂාව ඉගෙනගැනීමට ජනතාව උනන්දු කරවීම.<br>1882 මුස්ලිම් නේෂන් නමින් පුවත්පතක් ආරම්භ කිරීම.<br>කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම.<br>මුස්ලිම් අධ්‍යාපන සමිතිය නම් සංවිධානයක් පිහිටුවීම.<br>'මද්රාසා' මුස්ලිම් ආගමික පාසල් ප්‍රතිසංස්කරණය කිරීම. |
| T.B. ජායා මහතා | කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පති ලෙස පාසල දියුණු කිරීම.<br>ලංකාවේ ප්‍රදේශ කීපයකම මුස්ලිම් පාසල් පිහිටුවීම. |

1. ජාතික පුනරුදය යනු කුමක් ද?

2. බ්‍රිතාන්‍ය පාලනය යටතේ මෙරටට පැමිණි මිෂනාරි සංවිධාන නම් කරන්න.

3. චර්ච් මිෂනාරිවරුන් කුමන ප්‍රදේශවල තම කටයුතු මෙහෙය වූවේ ද?

4. මිෂනාරි සංවිධාන මුද්‍රණය කර බෙදාහැරිය ප්‍රකාශන නම් කරන්න.

5. බෞද්ධ පුනරුදය යනු කුමක් ද?

6. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපානන් විසින් පිහිටුවන ලද පිරිවෙන කුමක් ද?

7. බෞද්ධ පුනරුද සමයේ පිහිට වූ මුද්‍රණාල නම් කරන්න.

8. පංච මහා වාද හඳුන්වන්න.

9. පානදුරාවාදයට මුලිකත්වය දුන් හිමිපාණන් නම් කරන්න.

10. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා විසින් පිහිටුවන ලද සමාගම කුමක් ද?

11. ශ්‍රී ලංකා බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මිෂනාරි සමාගම් පැමිණියේ කුමන ආණ්ඩුකාරවරයාගේ සමයේදී ද?

12. අනගාරික ධර්මපාලතුමා බුද්ධාගමට කළ සේවය කෙටියෙන් පැහැදිලි කරන්න.

13. අමද්‍යප ව්‍යාපාරයේ සිටි නායකයන් හඳුන්වන්න.

14. හින්දු ආගමික පුනරුදයේ ආරුමුග නාවලර් තුමාගේ සේවය කෙටියෙන් පැහැදිලි කරන්න.

15. ඉස්ලාම් ආගමික පුනරුදයට M.C. සිද්ධි ලෙබ්බේතුමා ඉටුකල සේවය සඳහන් කරන්න.

16. සිද්ධි ලෙබ්බේ මහතාගේ මූලික අරමුණ වූයේ කුමක් ද?

17. ක්‍රි.ව 1882 දී ඉස්ලාම් ආගමිකයින් ආරම්භ කල පුවත්පත කුමක් ද?

18. ඊජිප්තුවේ සිට ඔරාබිපාෂා මහතා මෙරටට පැමිණියේ කුමන වර්ෂයේදී ද?

19. සිද්ධි ලෙබ්බේ මහතාගේ මූලිකත්වයෙන් කොළඹ ආරම්භ කල පාසල කුමක් ද?

20. සිද්ධි ලෙබ්බේ මහතා සමඟ ඉස්ලාම් ආගමික පුනර්ජීවනය වෙනුවෙන් කටයුතු කරන ලද්දේ කවුරුන් ද?

21. කොලඹ සහිරා විද්‍යාලයේ විදුහල්පතිව සිට එය දියුණු කලේ කවුරුන් ද?

01. පහත සඳහන් ප්‍රදේශවල සේවය කළ මිෂනාරි සංගම් අනුපිළිවෙලින් සඳහන් කරන්න.

I. A. කොළඹ

B. යාපනය

C. උතුරු නැගෙනහිර

D. ගාල්ල, කල්පිටි, මන්නාරම, නුවර

II. ලංකාවේ බුද්ධාගම ආරක්ෂා කිරීම සඳහා බෞද්ධ පුනරුද සංගම් විසින් පිහිටුවන ලද මුද්‍රණාල නම් කරන්න.

III. බුද්ධාගම ආරක්ෂා කිරීම සඳහා සංගම් විසින් ඉටුකල සේවයන් දෙකක් සඳහන් කරන්න.

.

IV. බෞද්ධ ආගමික පුනරුදයට නායකත්වය දුන් නායකයන් 03 දෙනෙක් සඳහන් කර ඔවුන් ගැන කෙටියෙන් පැහැදිලි කරන්න.

02. I. අමද්‍යප ව්‍යාපාරය පිහිට වූ නායකයන් තිදෙනෙකු නම් කරන්න.

II. පහත සඳහන් කරුණුවලට අදාල වන ආගමික නායකයන් සඳහන් කරන්න.

A. උදයභනු පුවත්පත ආරම්භ කිරීම

B. 1919 වසරේ දී ලංකා ජාතික සංගම් පිහිටුවීම

C. 1883 ඊජිප්තු රාජ්‍යයේ සිට පිටුවහල් කළ ඉස්ලාමීය නායකයා

D. ශ්‍රී ලංකාවේ පළමුවන මුස්ලිම් අමාත්‍යවරයා

III. ඉස්ලාම් ආගමික පුනරුදය වෙනුවෙන් සේවය කළ M.C.සිද්ධි ලෙබ්බේතුමාගේ සේවයන් දෙකක් සඳහන් කර ඒවා විස්තර කරන්න.

IV. ආරුමුග නාවලර්තුමා හින්දු ආගම් පුනරුදය සඳහා ද අධ්‍යයන පුනරුදය සඳහා ද කළ සේවයන් 03 ක් සඳහන් කර ඒවා විස්තර කරන්න.